PAFFREL

# පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය සඳහා වන

# පැෆ්රල් සංවිධානයේ යෝජනාවලිය

### සභිකධූර සංඛ්‍යාව අසාමාන්‍ය ලෙස වර්ධනය වීමට හේතු

ශ්‍රී ලංකාවේ තිබෙන පළාත් පාලන ආයතන 341 හි සමස්ථ සභිකධූර සංඛ්‍යාව 2018 අවසන් මැතිවරණයේදී ඊට පෙර පැවති ප්‍රමාණයට වඩා දෙගුණයකින් එකවර ඉහල යෑම බරපතල සමාජ, ආර්ථික හා දේශපාලන ලෙස සමාජ සංවාදයට ලක්ව තිබේ.

මෙයට හේතු වී ඇත්තේ දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයකම තිබෙන සභිකධූර සංඛ්‍යාව 2018 ට පෙර පැවතියාට වඩා විශාල අනුපාතිකයකින් 2018 දී වර්ධනය වී තිබීමයි.

එම සභිකධූර ප්‍රමාණය වැඩි වී ඇති අන්දම තෝරාගත් පළාත් පාලන ආයතන කිහිපයක නිදර්ශන ඇසුරින් පහත (i) වගුව මගින් පැහැදිලි කර ඇත.

(i) වගුව

| | පළාත් පාලන ආයතනය | 2018ට පෙර සිටි සභිකයින් සංඛ්‍යාව | 2018 න් පසුව දැනට සිටින සභිකයින් සංඛ්‍යාව | සභිකධූර ප්‍රමාණයේ වර්ධනය | වර්ධන අනුපාතිකය |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ ම.න.ස. | 53 | 119 | 66 | 124.5% |
| 02 | අත්තනගල්ල ප්‍රා.ස. | 23 | 54 | 31 | 134.8% |
| 03 | වලපනේ ප්‍රා.ස. | 22 | 55 | 33 | 150% |
| 04 | තංගල්ල ප්‍රා.ස. | 13 | 29 | 16 | 123.1% |
| 05 | වලිකාමම් උතුර ප්‍රා.ස. | 21 | 39 | 18 | 85.7% |
| 06 | මඩකලපුව ම.න.ස. | 19 | 38 | 19 | 100% |
| 07 | පන්නල ප්‍රා.ස. | 22 | 45 | 23 | 104.5% |
| 08 | තලාව ප්‍රා.ස. | 18 | 37 | 19 | 105.6% |
| 09 | තණමල්විල ප්‍රා.ස. | 17 | 35 | 18 | 105.9% |
| 10 | කුරුවිට ප්‍රා.ස. | 22 | 45 | 23 | 104.5% |

දිවයිනේ පළාත් නවයම ආවරණය වන ලෙස තෝරා ගැනුණු පළාත් පාලන ආයතන දහයකට අදාල ඉහත තොරතුරු විශ්ලේෂණය මගින් පැහැදිලි වන්නේ 2018 ට පෙර එක් එක් පළාත් පාලන ආයතනය තුළ සිටි නියෝජිතයින් ගණන 2018 න් පසුව දෙගුණ වී තිබෙන අන්දමයි.

එහෙත්, එම වර්ධනය දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයක් විෂයයෙහිම එකාකාර ලෙස සිදුවී නොමැති ආකාරයත්, ඊට අදාලව එකිනෙක පළාත් පාලන ආයතතන අතරෙහි දැඩි විෂමතා හටගෙන ඇති ආකාරයත් ඉහත විශ්ලේෂණයෙන් තව දුරටත් පැහැදිලි වෙයි.

එනම්, මෙහිදී නිදසුන් ලෙස සැලකිල්ලට යොමු කරනු ලැබූ පළාත් පාලන ආයතන 10 ක සුළු ප්‍රමාණය අතරෙහි පවා එම විෂමතා අනුපාතය එහි අවමය වන වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ 85.7% ක අගයේ සිට උපරිමය වන වලපනේ ප්‍රාදේශිය සභාවේ 150% ක අගය දක්වා 64.3% ක් තරම් විශාල අනුපාතික විෂමතාවයක් පෙන්වන බව පැහැදිලිය. එයද මෙම නව මැතිවරණ ක්‍රමයේ තවත් එක් ප්‍රබල අඩුපාඩුවක් ලෙස හඳුනා ගත හැකිය.

## සභිකධූර ගණන ඉහළ යෑමට බලපෑ හේතු

පළාත් පාලන ආයතනය තුළ පෙර පැවති සභිකධූර සංඛ්‍යාව නව මැතිවරණ ක්‍රමය යටතේ දෙගුණයකින් වර්ධනය වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධක 03 කි. එනම්;

1. පළාත් පාලන ආයතනයක් සඳහා අළුතින් නිර්මාණය කරන ලද ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව එම ආයතනය තුළ ඊට පෙර පැවති මුළු සභිකධූර සංඛ්‍යාවේ ප්‍රමාණයද ඉක්මවා යෑම.

2. අළුතින් නිර්මාණය කරන ලද ඡන්ද කොට්ඨාස ගණන පළාත් පාලන ආයතනයක නියෝජිතයන්ගේ ආංශික සංයුතියෙහි 60% ක බර තැබීමක් පමණක් ලෙසට සලකා සමානුපාතික ක්‍රමය යටතේ ඊට තවත් 40% ක නියෝජිතයින් සංඛ්‍යාවක් එකතු කර තිබීම.

3. නව මැතිවරණ ක්‍රමයට අවේණික, පාලනය කළ නොහැකි සහ නොවැළැක්විය හැකි තාක්ෂණික කාරණයක් ලෙස නිර්මාණය වන එල්ලෙන ආසන (Over Hang Seats) සංඛ්‍යාව සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගැනීම.

මෙම කාරණා එකිනෙක පහත පරිදි සැකෙවින් පැහැදිලි කළ හැකිය.

### 1.පළාත් පාලන ආයතනයක් සඳහා අළුතින් නිර්මාණය කරන ලද ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව එම ආයතනය තුළ ඊට පෙර පැවති මුළු සභිකධූර සංඛ්‍යාවේ ප්‍රමාණයද ඉක්මවා යෑම.

2011 දක්වා සමානුපාතික ක්‍රමයට පැවති පළාත් පාලන මැතිවරණ වලදී තෝරා ගන්නා ලද දිවයිනේ මුළු සභිකවරුන්ගේ සංඛ්‍යාව 4,480 දෙනෙකුට පමණක් සීමාවී තිබිණි.

එහෙත්, කොට්ඨාස - සමානුපාතික නව මැතිවරණ ක්‍රමය යටතේ දිවයිනේ දැනට ස්ථාපිත කොට තිබෙන කේවල සහ බහු ඡන්ද කොට්ඨාස 4,917 ක ප්‍රමාණය වෙනුවෙන් පමණක් තෝරා පත්කර ගත යුතුවන සභිකවරුන්ගේ සංඛ්‍යාව 5,092 ක් වෙයි. මෙය වත්මන් මුළු පළාත් පාලන ආයතන නියෝජිත සංයුතියෙහි 60% ක කොටසක් පමණි.

එහෙත් කොට්ඨාස පදනමින් පත්කර ගත යුතු එම 60% ක සභිකධූර ප්‍රමාණය වුවද 2011 දක්වා පැවති සමානුපාතික පළාත් පාලන මැතිවරණ වලදී තෝරා පත්කර ගනු ලැබූ මුළු සභිකධූර ගණනට වඩා ප්‍රමාණාත්මකව 612 කින් සහ ප්‍රතිශතාත්මකව 13.66% කින් ඉහළ ගොස් තිබේ.

එනිසා දිවයිනේ මුළු පළාත් පාලන ආයතන නියෝජිතයින් ගණන දෙගුණයකින් පමණ වැඩි වීමේදී ඡන්ද කොට්ඨාස ගණන වැඩිවීම පිළිබඳ මෙම කරුණ ඊට සැහෙන බලපෑමක් කර ඇත.

2017 නව සීමා නීර්ණය මගින් ස්ථාපිත කෙරුණු ඡන්ද කොට්ඨාස ගණන බොහෝ පළාත් පාලන ආයතන තුළ ඊට පෙර සිටි මුළු නියෝජිතයින් ගණනද ඉක්මවා ගොස් ඇති අන්දම තෝරාගත් පළාත් පාලන ආයතන කිහිපයක තොරතුරු ඇසුරින් සකසන ලද පහත (ii) වගුව මගින්ද පැහැදිලි වේ.

(ii) වගුව

| | පළාත් පාලන ආයතනය | 2018ට පෙර සිටි සභිකයින් සංඛ්‍යාව | 2018 දී ස්ථාපිත කළ කොට්ඨාස සංඛ්‍යාව | එම ප්‍රමාණයෙහි වර්ධනය | වර්ධන අනුපාතිකය |
|---|---|---|---|---|---|
| 01 | සීතාවක ප්‍රා.ස. | 21 | 26 | 05 | 23.8% |
| 02 | බියගම ප්‍රා.ස. | 23 | 32 | 09 | 39.1% |
| 03 | පාතහේවාහැට ප්‍රා.ස. | 22 | 25 | 03 | 13.6% |
| 04 | වැලිගම ප්‍රා.ස. | 22 | 25 | 03 | 13.6% |
| 05 | යාපනය ම.න.ස. | 23 | 27 | 04 | 17.4% |
| 06 | කන්තලේ ප්‍රා.ස. | 11 | 13 | 02 | 18.2% |
| 07 | වෙන්නපුව ප්‍රා.ස. | 22 | 25 | 03 | 13.6% |
| 08 | ලංකාපුර ප්‍රා.ස. | 12 | 14 | 02 | 16.7% |
| 09 | වැලිමඩ ප්‍රා.ස. | 21 | 25 | 04 | 19% |
| 10 | වරකාපොල ප්‍රා.ස. | 22 | 25 | 03 | 13.6% |

## 2. අළුතින් නිර්මාණය කරන ලද ඡන්ද කොට්ඨාස ගණන පළාත් පාලන ආයතනයක නියෝජිතයන්ගේ ආංශික සංයුතියෙහි 60% ක බර තැබීමක් පමණක් ලෙසට සලකා සමානුපාතික ක්‍රමය යටතේ ඊට තවත් 40% ක නියෝජිතයින් සංඛ්‍යාවක් එකතු කර තිබීම.

නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය යටතේ නියෝජිතයින් ගණන අසාමාන්‍ය පරිදි ඉහළ යෑමට බලපෑ වඩාත්ම ප්‍රබල සහ ප්‍රධාන හේතුව ලෙස මෙය හඳුනාගත හැකිය.

අළුතින් නිර්මාණය කරන ලද ඡන්ද කොට්ඨාස ගණන පවා බොහෝ පළාත් පාලන ආයතන වල පෙර පැවති මුළු නියෝජිතයින්ගේ ගණනද ඉක්මවා ගොස් තිබෙන පසුබිමෙහි එම ප්‍රමාණයට තවත් 40% ක නියෝජිතයින් සංඛ්‍යාවක් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ එකතු කිරීමට පියවර ගැනීමෙන් දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයකම නියෝජිත ධූර සංඛ්‍යාව පෙර නොවූ තරමට ඉහළ යෑම එතරම් පුදුමයක් නොවේ.

කොට්ඨාස - සමානුපාතික නියෝජන අනුපාතය 60% - 40% ලෙස ස්ථාවරව තබා ගෙන සාපේක්ෂව අඩු නියෝජිතයින් සංඛ්‍යාවක් යටතේ පළාත් පාලන මැතිවරණ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කළ යුතු බවට අදහසක් එහි සම්පාදක මඩුල්ල තුළතිබුනේ නම් ඔවුන් කළ යුතුව තිබූ සරලම දෙය වන්නේ සීමා නීර්ණ ක්‍රියාවලියට බලපාන පදනම් නිර්ණායක වල පරිමාණය මෙයට වඩා තරමක් විශාල කොට, පළාත් පාලන ආයතනයක් බෙදා වෙන් කරනු ලබන කොට්ඨාස ගණන ප්‍රමාණාත්මකව අඩු කිරීමට පියවර ගැනීමය.

එහෙත් එවැනි ප්‍රවේශයක් අනුගමනය නොකිරීම හේතුවෙන් නිර්මිත නව කොට්ඨාස ප්‍රමාණය පදනම් කර ගෙන ඊට 40% ක සමානුපාතික නියෝජනයක් ඈඳීමට යෑමෙන් පළාත් පාලන ආයතනයක් තුළ සිටිය යුතු නව සභිකයින්ගේ ප්‍රමාණය පාලනය කිරීමට හෝ සීමා කිරීමට නොහැකිවී ඇති ආකාරය පැහැදිලිව පෙනෙන්නට ඇත.

මෙම තත්ත්වය ප්‍රායෝගිකව ඇතිවී තිබෙන අන්දම පහත (iii) වගුවෙහි දැක්වෙන නිදසුන මගින්ද තවත් පැහැදිලි වන්නේය.

(iii) වගුව

| | පළාත් පාලන ආයතනය | 2018ට පෙර සිටි සභිකයින් සංඛ්‍යාව | සභිකධූර ගණන | | | | වැඩි වූ සභිකධූර සංඛ්‍යාව | වර්ධන අනුපාතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කොට්ඨාස පදනමින් | සමානුපාතික පදනමින් | එල්ලෙන ආසන | එකතුව | | |
| 1 | කැස්බෑව න.ස. | 17 | 20 | 13 | 2 | 35 | 18 | 109.9% |
| 2 | හොරණ ප්‍රා.ස. | 23 | 30 | 20 | 1 | 51 | 28 | 121.7% |
| 3 | විල්ගමුව ප්‍රා.ස. | 9 | 10 | 6 | 2 | 18 | 9 | 100% |
| 4 | හබරාදූව ප්‍රා.ස. | 13 | 15 | 10 | 2 | 27 | 14 | 107.7% |
| 5 | මන්නාරම ම.න.ස. | 9 | 12 | 8 | 1 | 21 | 12 | 133.3% |
| 6 | උහන ප්‍රා.ස. | 15 | 17 | 11 | 3 | 31 | 16 | 106.7% |
| 7 | නිකවැරටිය ප්‍රා.ස. | 19 | 21 | 14 | 5 | 40 | 21 | 110.5% |
| 8 | මැදවච්චිය ප්‍රා.ස. | 9 | 12 | 8 | 1 | 21 | 12 | 133.3% |
| 9 | බණ්ඩාරවෙල ප්‍රා.ස. | 9 | 10 | 6 | 2 | 18 | 9 | 100% |
| 10 | පැල්මඩුල්ල ප්‍රා.ස. | 19 | 22 | 14 | 2 | 38 | 19 | 100% |

## 3. නව මැතිවරණ ක්‍රමයට අවේණික, පාලනය කළ නොහැකි සහ නොවැළැක්විය හැකි තාක්ෂණික කාරණයක් ලෙස නිර්මාණය වන එල්ලෙන ආසන (Over Hang Seats) සංඛ්‍යාව සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගැනීම.

එල්ලෙන ආසන (Over Hang Seats) සංකල්පය මෙම නව කොට්ඨාස - සමානුපාතික මැතිවරණ ක්‍රමය හේතුවෙන් මෙරට තුළ මුල් වරට අළුතින්ම හඳුනා ගැනුණු තත්ත්වයකි.

කිසියම් පළාත් පාලන ආයතනයක් සඳහා ව්‍යවස්ථාපිතව නිශ්චය කොට තිබෙන සභිකධූර ප්‍රමාණයට අතිරේකව එහි ඡන්ද ප්‍රතිඵලයෙහි පවත්නා හුදු තාක්ෂණික කාරණාවල බලපෑම මත නොවැළැක්විය හැකි තත්ත්වයන් යටතේ අනපේක්ෂිත ලෙස උද්ගත වන අමතර ආසන මෙලෙස එල්ලෙන ආසන (Over Hang Seats) වශයෙන් හඳුන්වනු ලැබේ.

මෙවැනි එල්ලෙන ආසන සෑම පළාත් පාලන ආයතනයක් තුළම නිර්මාණය නොවනවා සේම එක් ආයතනයක් තුළ සාමාන්‍යයෙන් නිර්මාණය විය හැකි එවැනි ආසන ගණනද සාපේක්ෂ වශයෙන් සීමාසහිත වේ. එය බොහෝ විට පවතින්නේ 01 - 03 අතර සීමාවේය. සුවිශේෂී තත්ත්වයන් මත ඇතැම් පළාත් පාලන ආයතන තුළ අසාමාන්‍ය ආකාරයට එල්ලෙන ආසන ඊට වඩා ප්‍රමාණයක් නිර්මාණය විය හැකි අවස්ථාවන්ද තිබුණත් එය සාපේක්ෂව බෙහෙවින් අඩු තත්ත්වයකි.

එහෙත්, දිවයිනේ පළාත් පාලන ආයතන පද්ධතියෙන් බහුතරයක හෝ සැලකිය යුතු ප්‍රමාණයක මෙවැනි එල්ලෙන ආසන (Over Hang Seats) නිර්මාණය වී තිබුණහොත් එමගින් අවසාන මැතිවරණ ප්‍රතිඵලය තුළ බිහිවන සභිකධූර සංඛ්‍යාවද නිතැතින්ම ඉහළ යන්නේය. 2018 පළාත් පාලන මැතිවරණයේදීද අප දුටුවේ එවැනි තත්ත්වයකි.

එම 2018 අවසන් මැතිවරණයේදී ඡන්ද විමසීම පැවති පළාත් පාලන ආයතන 341 න් 204 ක හෙවත් ඉන් 60% කම මෙවැනි එල්ලෙන ආසන නිර්මාණය වී තිබිණි. එලෙස නිර්මිත මුළු එල්ලෙන ආසන ගණන 383 ක් විය. එය වූ කලී මැතිවරණයේදී තෝරා ගැනීමට නියමිතව තිබූ ව්‍යවස්ථාපිතව නිශ්චිත සභිකධූර ප්‍රමාණයට වඩා තවත් 4.6% ක අමතර ප්‍රමාණයකි.

ඒ අනුව, 2011 දීට සාපේක්ෂව 2018 දී රට තුළ පළාත් පාලන ආයතන නියෝජිත ධූර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වර්ධනය වීමේදී එයට එල්ලෙන ආසන (Over Hang Seats) මගින්ද පැහැදිලි බලපෑමක් එල්ල කොට ඇති අයුරු පෙනී යයි.

2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල මත ආයතන මට්ටමින් එල්ලෙන ආසන නිර්මාණය වී තිබුණු අන්දම පහත (vi) වගුවෙහි පැහැදිලි කෙරේ.

(iv) වගුව

| නිර්මාණය වී තිබුණු එල්ලෙන ආසන සංඛ්‍යාව | පළාත් පාලන ආයතන ගණන | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කිසිවක් නැති | 136 | 40% |
| 01 ක් බැගින් | 90 | 26.2% |
| 02 ක් බැගින් | 74 | 21.8% |
| 03 ක් බැගින් | 28 | 8.2% |
| 04 ක් බැගින් | 09 | 2.6% |
| 05 ක් බැගින් | 02 | 0.6% |
| 06 ක් බැගින් | 01 | 0.3% |
| 09 ක් බැගින් | 01 | 0.3% |
| එකතුව | 341 | 100% |

එසේම දිවයිනේ එක් එක් දිස්ත්‍රික්කය තුළ නිර්මාණය වී තිබිණු මුළු එල්ලෙන ආසන සංඛ්‍යාව සහ ඒවා නිර්මාණය වී තිබුණු ආයතන සංඛ්‍යාව පිළිබඳ විස්තරයක් පහත (iv) වගුවෙහි ඇතුළත්ය.

(V) වගුව

| | දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන ගණන | එල්ලෙන ආසන නිර්මාණය වූ ආයතන ගණන | නිර්මිත මුළු එල්ලෙන ආසන ගණන |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 13 | 8 | 29 |
| 2 | ගම්පහ | 19 | 14 | 29 |
| 3 | කළුතර | 17 | 11 | 16 |
| 4 | මහනුවර | 22 | 9 | 17 |
| 5 | මාතලේ | 13 | 7 | 11 |
| 6 | නුවරඑළිය | 12 | 5 | 8 |
| 7 | ගාල්ල | 20 | 18 | 32 |
| 8 | මාතර | 17 | 14 | 18 |
| 9 | හම්බන්තොට | 12 | 9 | 17 |
| 10 | යාපනය | 17 | 6 | 13 |
| 11 | කිලිනොච්චි | 3 | 1 | 2 |
| 12 | මන්නාරම | 5 | 3 | 6 |
| 13 | වව්නියාව | 5 | 4 | 9 |
| 14 | මුලතිව් | 4 | 2 | 5 |
| 15 | මඩකලපුව | 12 | 7 | 14 |
| 16 | අම්පාර | 20 | 9 | 15 |
| 17 | ත්‍රිකුණාමලය | 13 | 6 | 13 |
| 18 | කුරුණෑගල | 21 | 16 | 38 |
| 19 | පුත්තලම | 12 | 5 | 7 |
| 20 | අනුරාධපුර | 19 | 16 | 31 |
| 21 | පොළොන්නරුව | 8 | 4 | 7 |
| 22 | බදුල්ල | 18 | 7 | 10 |
| 23 | මොණරාගල | 10 | 8 | 10 |
| 24 | රත්නපුර | 17 | 9 | 14 |
| 25 | කෑගල්ල | 12 | 7 | 12 |
| | එකතුව | 341 | 205 | 383 |

## සභිකධූර සංඛ්‍යාව අඩු කිරීම සඳහා වන යෝජනාව

වර්තමානයේදී දැඩි වියවුල් සහගත අන්දමට නිර්මාණය වී තිබෙන ඉතාම අධික සහ රටට කිසිසේත්ම ඔරොත්තු නොදෙන මෙම අතිවිශාල පළාත් පාලන ආයතන නියෝජිත ධූර සංඛ්‍යාව අඩු කිරීම පිණිස ප්‍රධාන යෝජනා දෙකක් සහ ඊට අමතරව එක් වෛකල්පිත පියවරක් පහත පරිදි යෝජනා ඉදිරිපත් කරමි.

**යෝජනා අංක 1**

**එක් එක් පළාත් පාලන ආයතනය තුළ දැනට පවතින ඡන්ද කොට්ඨාස ප්‍රමාණය 20% කින් කපා හැරීම**

මෙහිදී පළාත් පාලන ආයතන තුළ දැනට තිබෙන ඡන්ද කොට්ඨාස ප්‍රමාණයෙන් 1/5 ක ප්‍රමාණයක් අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයක් සඳහාම මෙම අඩු කිරීමේ අනුපාතිකය එක සමාන ලෙස ක්‍රියාත්මක කළ යුතුය. එමගින් ඉකුත් සීමා නිර්ණයේදී සැලකිල්ලට ගෙන ඇති භූමි ප්‍රමාණය සහ ජනගහණය යන විචල්‍යයන්හි ස්ථාවරභාවය තවදුරටත් එලෙසම ආරක්ෂා කළ හැකිවනු ඇත.

මෙම පළමුවැනි යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් පසුව දිවයින තුළ බිහිවන නව ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව 4,081 කි.

එය දැනට පවතින සංඛ්‍යාවට වඩා කොට්ඨාස 1,011 ක සැලකිය යුතු සහ පැහැදිලි අඩු වීමකි.

සමස්ත දිවයින සඳහාම බලපාන එම අඩු වීමේ අනුපාතිකය 19.85% කි. එනම්, එය මෙම පළමුවැනි යෝජනාව යටතේ අපේක්ෂා කරනු ලැබූ ඡන්ද කොට්ඨාස ප්‍රමාණය 1/5 කින් අඩු කිරීමේ මට්ටමට පැමිණ තිබේ.

මෙම කොට්ඨාස ප්‍රමාණය 20% අඩු කිරීම සඳහා පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කළ හැක.

1 විශාල ඡන්ද කොට්ඨාස ගණනක් තිබෙන ආසනවල එකිනෙකට සමීපව පිහිටි ජනවාර්ගික හා සංස්කෘතික ලක්ෂණ අතින් සමානකම් දරන කුඩා ඡන්ද කොට්ඨාස දෙකක් ඒකාබද්ධ කොට තනි කොට්ඨාසයක් පිහිටුවීම.

2 අඩු ඡන්ද කොට්ඨාස ගණනක් තිබෙන ආයතනවල එකිනෙකට සමීපව පිහිටි කොට්ඨාසයන්හි පිහිටි ග්‍රාම නිලධාරී වසම් කිහිපයක් ඊට යාබදව පිහිටි සමාන ජනවාර්ගික හා සංස්කෘතික ලක්ෂණ සහිත කොට්ඨාසවලට ඈඳීම.

3 සමහර කේවල කොට්ඨාසවල ඇති ජනවාර්ගික හා සංස්කෘතික පසුබිම ශලකා ඒවා ඊට යාබදව පිහිටි බහු ඡන්ද කොට්ඨාසවලට ඈඳීම.

4 කේවල ඡන්ද කොට්ඨාස තුනක් ඒකාබද්ධ කිරීම මගින් නියෝජිතයින් දෙදෙනෙකු පමණක් තේරී පත්වන නව ද්වි මන්ත්‍රී බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයක් නිර්මාණය කිරීම.

මෙම පළමුවැනි යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් පසුව එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් හිමිවන නව ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව සඳහා පහත (අ) වගුව බලන්න

**(අ) වගුව**

**නව යෝජනාවලිය අනුව එක් එක් පළාත් පාලන ආයතනය සඳහා හිමිවන වන ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව සහ එය දැනට පවතින ප්‍රමාණයට වඩා අඩුවන සංඛ්‍යාව**

**01. කොළඹ දිස්ත්‍රික්කය** (වගුව vi )

| පළාත් පාලන ආයතනය | දැනට තිබෙන කොට්ඨාස සංඛ්‍යාව | හිමිවන නව කොට්ඨාස සංඛ්‍යාව | කොට්ඨාස සංඛ්‍යාවේ අඩුවීම |
|---|---|---|---|
| කොළඹ ම.න.ස. | 66 | 53 | 13 |
| දෙහිවල - ගල්කිස්ස ම.න.ස. | 29 | 23 | 06 |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ම.න.ස. | 21 | 17 | 04 |
| මොරටුව ම.න.ස. | 29 | 23 | 06 |
| කඩුවෙල ම.න.ස. | 28 | 22 | 06 |
| කොලොන්නාව න.ස. | 11 | 09 | 02 |
| සීතාවකපුර න.ස. | 14 | 11 | 03 |
| මහරගම න.ස. | 25 | 20 | 05 |
| කැස්බෑව න.ස. | 20 | 16 | 04 |
| බොරලැස්ගමුව න.ස. | 10 | 08 | 02 |
| කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රා.ස. | 22 | 18 | 04 |
| සීතාවක ප්‍රා.ස. | 26 | 21 | 05 |
| හෝමාගම ප්‍රා.ස. | 28 | 22 | 06 |
| එකතුව | 329 | 263 | 66 |

**යෝජනා අංක 2**

**කොට්ඨාස - සමානුපාතික පදනම මත දැනට බලපැවැත්වෙන 60% - 40% අනුපාතිකය 70%-30% ලෙස සංශෝධනය කිරීම**

මෙම දෙවැනි යෝජනාව යටතේ පළාත් පාලන ආයතනයක් තුළ දැනට බලපැවැත්වෙන 70%-30% ලෙස සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

එම සංශෝධිත නව අනුපාතයන් ගණනය කෙරෙන්නේ එක් එක් පළාත් පාලන ආයතන සඳහා ඉහත පළමුවැනි යෝජනාව අනුගමනය කිරීමෙන් පසුව ලැබී තිබෙන නව ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව පදනම් කර ගෙන ය.

එබැවින්, මේ නව නිර්ණායක මත දෙවැනි යෝජනාව යටතේ සභිකධූර සංඛ්‍යාව අඩු වීමට බලපාන ප්‍රධාන කරුණු දෙකකි. එනම්,

1 ඡන්ද කොට්ඨාස ගණන සාපේක්ෂව අඩුවී තිබීමේ හේතුව මත ඊට අනුපාතිකව හිමිවිය යුතු සමානුපාතික සභිකධූර ගණන ද පහළ යෑම

2 කොට්ඨාස - සමානුපාතික ආශික සංයුතියෙහි සමානුපාතික විචල්‍යයට අදාළ බර තැබීම 40% සිට 30% දක්වා අඩු කිරීම මත තීරණය වන සමානුපාතික නියෝජිත ධූර ගණන ද තවත් පහත වැටීම

මෙම දෙවැනි යෝජනාව යටතේ ඉහත (අ) සහ (ආ) හේතුවල බලපෑම මත දිවයිනේ සියලු පළාත් පාලන ආයතන වෙනුවෙන් සමානුපාතික ක්‍රමයට හිමිවිය යුතු මුලු සභිකධූර ගණන 1723 කි.

වර්තමානයේදී පවතින මුලු සමානුපාතික සභිකධූර ගණන 3264 කි.

ඒ අනුව මෙම දෙවැනි පියවර යටතේ සමානුපාතික සභික ධූර සංඛ්‍යාව 1541 කින් ඉතා පැහැදිලි ලෙස අඩුවනු ඇත.

එම අඩුවීමේ අනුපාතිකය 47.21% කි.

මෙම දෙවැනි පියවරෙහි ක්‍රියාකාරිත්වය තුළින් එක් එක් පළාත් පාලන ආයතනකට හිමිවන නව සමානුපාතික සභිකධූර සංඛ්‍යාව සහ එය දැනට පවතින සංඛ්‍යාවට වඩා අඩුවන ප්‍රමාණය සම්බන්ධ විස්තර සඳහා පහත (ආ) වගුව බලන්න.

(ආ) වගුව

**මෙම යෝජනාවලිය අනුව එක් එක් පළාත් පාලන ආයතන සඳහා හිමිවන නව සමානුපාතික සභිකධූර සංඛ්‍යාව සහ එය දැනට පවතින ප්‍රමාණයට වඩා අඩුවන සංඛ්‍යාව**

**01. කොළඹ දිස්ත්‍රික්කය** (වගුව vii )

| පළාත් පාලන ආයතනය | සමානුපාතික සභිකධූර | | |
|---|---|---|---|
| | දැනට තිබෙන සංඛ්‍යාව | යෝජිත නව සංඛ්‍යාව | අඩුවන ප්‍රමාණය |
| කොළඹ ම.න.ස. | 44 | 23 | 21 |
| දෙහිවල - ගල්කිස්ස ම.න.ස. | 19 | 10 | 09 |
| ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ ම.න.ස. | 14 | 07 | 07 |
| මොරටුව ම.න.ස. | 19 | 10 | 09 |
| කඩුවෙල ම.න.ස. | 18 | 09 | 09 |
| කොලොන්නාව ම.න.ස. | 07 | 04 | 03 |
| සීතාවකපුර ම.න.ස. | 09 | 05 | 04 |
| මහරගම ම.න.ස. | 16 | 09 | 07 |
| කැස්බෑව න.ස. | 13 | 07 | 06 |
| බොරලැස්ගමුව න.ස. | 6 | 03 | 03 |
| කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස. | 14 | 08 | 06 |
| සීතාවක ප්‍රා.ස. | 17 | 09 | 08 |
| හෝමාගම ප්‍රා.ස. | 18 | 09 | 09 |
| එකතුව | 214 | 113 | 101 |

## පළමුවැනි සහ දෙවැනි පියවර දෙකෙහි ඒකාබද්ධ බලපෑමේ ප්‍රතිඵලය

ඉහත පළමුවැනි සහ දෙවැනි යෝජනා දෙක යටතේ නිර්මාණය වන නව සභිකධූර සංඛ්‍යාවේ මුලු එකතුව 5804 කි.

එය එල්ලෙන ආසන හැර දැනට තිබෙන ව්‍යවස්ථාපිත මුලු සභිකධූර ප්‍රමාණයකට වඩා 2552 කින් අඩුය.

එම අඩුවීමෙහි සමස්ත අනුපාතය 30.54 % කි.

එසේම මෙලෙස අලුතින් බිහිවන මුලු සභිකධූර ගණන එල්ලෙන ආසන ද ඇතුලුව දැනට තිබෙන ව්‍යවස්ථාපිත මුලු සභිකධූර ප්‍රමාණයකට වඩා 2934කින් අඩුය.

මේ අඩු වීමෙහි සමස්ත අනුපාතය 33.58 % කි.

ඒ අනුව මෙම නව යෝජනාවලිය තුළින් පළාත් පාලන ආයතන තුළ දැනට පවතින සභිකධූර ප්‍රමාණයෙහි 30% කින් පමණ වන අඩුවීම දිස්ත්‍රික්ක පදනමින් සටහන් වන අයුරු පහත (viii) වගුව මගින් දක්වා ඇත.

**(viii) වගුව**

| | දිස්ත්‍රික්කය | අඩුවන සභිකධූර ගණන | සභිකධූර අඩුවීමේ අනුපාතය (%) |
|---|---|---|---|
| 1 | කොළඹ | 167 | 30.8% |
| 2 | ගම්පහ | 212 | 30.8% |
| 3 | කළුතර | 139 | 30.4% |
| 4 | මහනුවර | 192 | 31.0% |
| 5 | මාතලේ | 84 | 30.8% |
| 6 | නුවරඑළිය | 96 | 31.4% |
| 7 | ගාල්ල | 137 | 30.6% |
| 8 | මාතර | 107 | 29.3% |
| 9 | හම්බන්තොට | 79 | 30.2% |
| 10 | යාපනය | 123 | 30.6% |
| 11 | කිලිනොච්චි | 20 | 30.3% |
| 12 | මන්නාරම | 28 | 31.8% |
| 13 | වව්නියාව | 30 | 29.1% |
| 14 | මුලතිව් | 21 | 31.3% |
| 15 | මඩකලපුව | 73 | 30.7% |
| 16 | අම්පාර | 113 | 29.9% |
| 17 | ත්‍රිකුණාමලය | 69 | 31.4% |
| 18 | කුරුණෑගල | 188 | 30.3% |
| 19 | පුත්තලම | 95 | 31.0% |
| 20 | අනුරාධපුර | 111 | 29.8% |
| 21 | පොළොන්නරුව | 52 | 31.3% |
| 22 | බදුල්ල | 120 | 30.7% |
| 23 | මොණරාගල | 59 | 29.8% |
| 24 | රත්නපුර | 128 | 30.3% |
| 25 | කෑගල්ල | 109 | 30.5% |
| | එකතුව | 2,552 | 30.54% |

(ඇ) වගුව

**නව යෝජනාවලිය අනුව එක් එක් පළාත් පාලන ආයතනය සඳහා ඡන්ද කොට්ඨාස මට්ටමින් සමානුපාතික මට්ටමින් සහ එම දෙකෙහිම එකතුවෙන් හිමිවන සභිකධූර සංඛ්‍යාව**

**01. කොළඹ දිස්ත්‍රික්කය**

| පළාත් පාලන ආයතනය | හිමිවන නව කොට්ඨාස සංඛ්‍යාව | සමානුපාතිකව හිමිවන සභික සංඛ්‍යාව | සභික සංඛ්‍යාවේ මුලු එකතුව |
|---|---|---|---|
| කොළඹ ම.න.ස. | 53 | 23 | 76 |
| දෙහිවල - ගල්කිස්ස ම.න.ස. | 23 | 10 | 33 |
| ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ ම.න.ස. | 17 | 07 | 24 |
| මොරටුව ම.න.ස. | 23 | 10 | 33 |
| කඩුවෙල ම.න.ස. | 22 | 09 | 31 |
| කොලොන්නාව ම.න.ස. | 09 | 04 | 13 |
| සීතාවකපුර ම.න.ස. | 11 | 05 | 16 |
| මහරගම ම.න.ස. | 20 | 09 | 29 |
| කැස්බෑව න.ස. | 16 | 07 | 23 |
| බොරලැස්ගමුව න.ස. | 08 | 03 | 11 |
| කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස. | 18 | 08 | 26 |
| සීතාවක ප්‍රා.ස. | 21 | 09 | 30 |
| හෝමාගම ප්‍රා.ස. | 22 | 09 | 31 |
| එකතුව | 263 | 113 | 376 |

**යෝජනා අංක 3**

**එල්ලෙන ආසන සංඛ්‍යාව අවම කිරීම**

යෝජනාවලියෙහි තෙවන යෝජනාව වන්නේ එල්ලෙන ආසන සංඛ්‍යාව අඩු කිරීමයි.

2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල මත නිර්මාණය වී තිබෙන දිවයිනේ මුලු එල්ලෙන ආසන (Over Hang Seats) ගණන 382 කි.

මේවා ඡන්ද ප්‍රතිඵලයේ ස්වභාවය අනුව තාක්ෂණික හේතූන් මත ස්වයංක්‍රීයවම නිර්මාණය වන ආසන වේ.

එබැවින් පවතින යම් නිශ්චිත තත්ත්වයක් යටතේ මෙම එල්ලෙන ආසන ප්‍රමාණය පාලනය කිරීම හෝ සීමා කිරීම අසීරු වේ.

එහෙත්, එල්ලෙන ආසන ගණන තීරණය වීම සඳහා පළාත් පාලන ආයතනයක් තුළ තිබෙන ඡන්ද කොට්ඨාස ගණන තීරණාත්මක ලෙස බලපායි.

එසේ වන්නේ විශාල ඡන්ද කොට්ඨාස ගණනක් සහිත ආයතනයක ඇති එම කොට්ඨාසවලින් සාතිශය බහුතරය එකම දේශපාලන පක්ෂයක් විසින් ජයගෙන ඇති අවස්ථාවක එහි නිර්මාණය විය හැකි එල්ලෙන ආසන සංඛ්‍යාව සාපේක්ෂව අඩු ඡන්ද කොට්ඨාස ගණනක් හිමිවන ආයතනයකදී ඇති වන එවැනිම අවස්ථාවකදී වඩා වැඩි වන බැවිනි.

මේ නිසා ඡන්ද කොට්ඨාස ගණන සාපේක්ෂව අඩු වීමෙන් නිර්මාණය විය හැකි එල්ලෙන ආසන සංඛ්‍යාව ද සාපේක්ෂව පහළ බසිනු ඇති බවට මේ අනුව අපේක්ෂා කළ හැකිය.

පසුගිය 2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල අනුව එල්ලෙන ආසන 03 ක් හෝ ඊට වැඩියෙන් නිර්මාණය වී තිබුණු පළාත් පාලන ආයතන ගණන 41 කි.

එලෙස සාපේක්ෂ වශයෙන් වැඩි එල්ලෙන ආසන ප්‍රමාණයක් නිර්මාණය වී තිබුණු පළාත් පාලන ආයතනවල සමස්ත සභිකධූර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත (ix) වගුවට ඇතුළත් වේ.

එයින් ද පැහැදිලි වන්නේ එල්ලෙන ආසන සාපේක්ෂව වැඩි ගණනක් නිර්මාණය වීමේ අධික සම්භාවිතාවය තිබී ඇත්තේ මුලු සභිකධූර ප්‍රමාණය ද ඉහළ මට්ටමක පවතින පළාත් පාලන ආයතන තුළ බවය.

(ix) වගුව

| **එල්ලෙන ආසන නිර්මාණය වූ අවස්ථා** | |
|---|---|
| ආයතනයේ මුලු සභිකධූර සංඛ්‍යාව | ආයතන ගණන |
| 110 | 01 |
| 50 | 01 |
| 48 | 01 |
| 46 | 02 |
| 43 | 02 |
| 41 | 04 |
| 40 | 01 |
| 38 | 02 |
| 36 | 01 |
| 35 | 03 |
| 33 | 02 |
| 31 | 03 |
| 30 | 01 |
| 28 | 03 |
| 26 | 03 |
| 25 | 02 |
| 23 | 01 |
| 21 | 05 |
| 20 | 01 |
| 18 | 01 |
| 13 | 01 |
| එකතුව | 41 |

2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල මත එල්ලෙන ආසන නිර්මාණය වී තිබූ ආයතන 41 න් 39 ක හෙවත් ඉන් 95.5% කම සභිකධූර සංඛ්‍යාව 20කට වැඩි අගයක් ගෙන ඇති අයුරු ඉහත (ix) වගුවෙන් පෙනී යයි.

සභිකධූර සංඛ්‍යාව 20කට වඩා අඩු කුඩා පළාත් පාලන ආයතන 137 ක්ම දිවයිනේ තිබේ. එහෙත් එම ආයතන අතුරින් පසුගිය මැතිවරණයේදී එල්ලෙන ආසන 03ක් හෝ නිර්මාණය වී තිබුණේ ආයතන 02 ක් තුළ පමණය. එය එම මුලු ආයතන ගණනින් 1.5% ක නොතැකිය යුතු තරම් ඉතා සුලුතරයක් පමණි.

මින් පෙනෙන්නේ සභිකධූර සංඛ්‍යාව අඩුවන විට එල්ලෙන ආසන බිහිවීමට ඇති ඉඩකඩද ඉඳුරාම අඩුවන බවය.

## අතිරේක වශයෙන් යෝජනා කරනු ලබන වෛකල්පිත පස්වැනි යෝජනාව

## පළාත් පාලන ආයතනයක සභිකධූරයකට හිමිකම් පෑම සඳහා අවශ්‍ය අවම ව්‍යවස්ථාපිත කඩඉම් ඡන්ද ප්‍රතිශතයක් නියම කිරීම

තුන්වන යෝජනාව යටතේ පළාත් පාලන ආයතනයක සභික ධූරයකට හිමිකම් පෑම සඳහා අවශ්‍ය වන අවම ව්‍යවස්ථාපිත කඩඉම් ඡන්ද ප්‍රතිශතයක් නියම කිරීමට යෝජනා කෙරේ.

මෙම අවම ව්‍යවස්ථාපිත කඩඉම් ඡන්ද ප්‍රතිශතය සෑම පළාත් පාලන ආයතනයක් විෂයයෙහිම අනිවාර්යය කොට ක්‍රියාත්මක කළ යුතුය.

මෙයින් සභිකධූර සංඛ්‍යාව අඩු කිරීම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල නොවන හෙයින් එය මෙම යෝජනාවලියෙහි වෛකල්පිත පියවරක් වශයෙන් ඇතුළත් කොට තිබේ.

සභික ධූර සංඛ්‍යාව අඩු කිරීම සඳහා ඍජු බලපෑමක් නොවුණද, සභිකධූර සංඛ්‍යාව අසාමාන්‍ය ලෙස ඉහළ යෑම හේතුකොට ගෙන වර්තමානයේදී උද්ගත වී තිබෙන සංකීර්ණ ගැටලු බොහොමයක් සමනය කර ගැනීම පිණිස මෙම යෝජනාව ඉතා සඵලදායී වක්‍ර දායකත්වයක් දක්වනු ඇත.

නොතැකිය යුතු තරමේ ඉතාම සොච්චම් ඡන්ද ප්‍රමාණයක් පමණක් ලබා ගන්නා හුදු බෝඩ් ලෑලිවලට පමණක් සීමා වන කුඩා දේශපාලන පක්ෂවලට සහ ස්වාධීන කණ්ඩායම්වලට අනවශ්‍ය පරිදි ආසන හිමිවීමෙන් ( මෙම වාරණය සද්භාවයෙන් යුතුව මැතිවරණ සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලට අදාළ නොවේ.) පළාත් පාලන ආයතන පද්ධතිය තුළ දැනට නිර්මාණය වී තිබෙන ජයග්‍රාහී පාර්ශ්වයට පැහැදිලි බහුතරයක් ලබා ගැනීමට නොහැකි වීමේ දැඩි දේශපාලන ව්‍යාකූලභාවයට මෙම පියවර මගින් යහපත් බලපෑමක් එල්ල වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එවැනි නිශ්චිත ව්‍යවස්ථාපිත අවම කඩඉම් ඡන්ද සීමාවක් නීතියෙන්ම පැනවූ බසුව අනවශ්‍ය ලෙස මැතිවරණය සඳහා කුඩා පක්ෂ හා කණ්ඩායම් සීමාවකින් තොව ඉදිරිපත් වීම ද සැලකිය යුතු මට්ටමකින් අධෛර්යයමත් වී, ස්වයංකීයවම පාලනය වනු ඇත. එනිසා තරග කණ්ඩායම් ගණනද නිතැතින්ම අඩුවනු ඇත. එය මැතිවරණයේ සංවිධාන ක්‍රියාවලියට පවා පහසුවකි.

පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දැනට බලපැවැත්වෙන ව්‍යවස්ථාපිත අවම කඩඉම් ඡන්ද සීමාව 5% ක්ව පවතින හෙයින් ඊට වඩා අඩු ඉන් අඩක් වන 2.5% ක කඩඉම් ඡන්ද සීමාවක් පළාත් පාලන මැතිවරණය විෂයයෙහි බලපැවැත්වෙන ලෙස පැනවිය යුතු බවට යෝජනා කෙරේ.

ගියවර සභිකධූර දිනා ගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් රැසක්ම ලබාගෙන ඇති ඡන්ද ප්‍රතිශතයන් මෙම 2.5% සීමාවට වඩා අඩුය. නමුත් ඔවුන් අතර බෙදී ගොස් තිබෙන සභිකධූර සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී.

නිදසුනක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේදී පමණක් එහි ඇති පළාත් පාලන ආයතන 13 න් 06 කදිම 2.5% කට වඩා අඩු ඡන්ද ප්‍රමාණයක් පමණක් ලබාගත් දේශපාලන සහ ස්වාධීන කණ්ඩායම 11 කට සභිකධූර 13ක්ම හිමිවී තිබේ.

එම තත්ත්වයන්ද සැලකිල්ලට ගනිමින් මෙම යෝජනාව ඉදිරිපිත් කරනු ලැබේ.

පැරණි සමානුපාතික මැතිවරණ ක්‍රමයේදී මෙන් පළාත් පාලන ආයතනයක බලය තහවුරු කර ගැනීම සඳහා එහි වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් ජයග්‍රහණය කරන පක්ෂයට හෝ කණ්ඩායමට ප්‍රසාද ආසන පිරිනොනැමෙන වර්තමාන තත්ත්වය තුළ මෙම යෝජනාව වඩාත් කාලෝචිත සහ අර්තවවත් වනු නියතය.

## නාමයෝජනා ලබාදීම

### පදිංචිය සනාථ කිරීමට ක්‍රමවේදයක්

පළාත් පාලන මැතිවරණ පනතට අනුව අපේක්ෂකයා අදාළ පළාත් පාලන බලප්‍රදේශයේ පදිංචිකරුවකු විය යුතු වුවද එය පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය මැතිවරණයේදී මහරගම නගර සභාවට දිස්ත්‍රික්කයෙන් පිට පදිංචිකරුවන්ට පවා නාමයෝජනා ලබාදීමට හැකිවිය. එබැවින් සෑම අපේක්ෂකයෙකුම නාමයෝජනා ලබාදීමේදී තමන් එම පළාත් පාලන බලප්‍රදේශයේ ජීවත්වන බවට ග්‍රාම නිලධාරී සහතිකයක් හෝ අදාළ බලප්‍රදේශයේ ඡන්ද නාම ලේඛනයේ සහතික උද්ධෘතයක් නාම යෝජනා පත්‍රයට ඇතුල් කිරීම අනිවාර්යය කළ යුතුය.

### රාජ්‍ය නිලධාරීන් තරග කරන ප්‍රදේශයෙන් බැහැර රාජකාරී කරන බවට සහතිකයක්

දේශපාලන අයිතිවාසිකම් හිමි සමහර රාජ්‍ය නිලධාරීන් මැතිවරණවලදී තරග කරන විට ඔවුන්ගේ රාජකාරී බලය හා රාජ්‍ය සම්පත් ඔවුන්ගේ ජයග්‍රහණයට හේතුවන බව බැලූ බැල්මට පෙනෙන කාරණයකි. විශේෂයෙන්ම මෙය සමාජ සුභසාධක කටයුතුවලට සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් අරභයා බරපතල කරුණකි. මෙම කරුණු සැලකිල්ලට ගෙන එවැනි රාජ්‍ය නිලධාරීන් මාස 6 කට පෙර තමා කරග කිරීමට අපේක්ෂිත බලප්‍රදේශයෙන් බැහැරට මාරු විය යුතු බවට පනතේ සඳහන් කළද එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමක් දක්නට නොලැබිණි. එබැවින් නාම යෝජනා ලබාදීමේදී රාජ්‍ය නිලධාරීන් තමා එම බලප්‍රදේශයේ නාම යෝජනා දිනට මාස 6 කට පෙරාතුව රාජකාරී නොකළ බවට පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කිරීම අනිවාර්යය කළ යුතුය.

### වත්කම් බැරකම් ප්‍රකාශ නාමයෝජනා සමග ලබාදීම

පළාත් පාලන මැතිවරණවලට තරග කරන බොහෝ දෙනා සිය වත්කම් බැරකම් ප්‍රකාශ නියමිත මාස 3 ක කාලය තුළ ලබාදීම හෝ ඉන් පසුව ලබාදීමට ක්‍රියා නොකරයි. එමෙන්ම පළාත් පාලනයේදී කිසිදු දේශපාලන හෝ මහජන පදනමකින් තොරව විශාල අපේක්ෂකයන් ප්‍රමාණයක් තරග කරයි. මෙම තත්ත්වය වළක්වා යහපත් දේශපාලන සංස්කෘතියක් සඳහා නාම යෝජනා ලබාදීමේදී නාමයෝජනා පත්‍රය සමග වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම අනිවාර්යය කළ යුතුය.

**වර්තමානයේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම තාක්ෂණික කරුණු කිහිපයකට පමණක් සීමා වී ඇත. එබැවින් පහත සඳහන් කරුණු නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමේ නිර්ණායක තුළට ඇතුලත් කළ යුතුය.**

1. අදාළ ඡන්ද බලප්‍රදේශයේ පදිංචිය සනාථ කිරීම සඳහා විධිමත් ලේඛන ඉදිරිපත් කිරීම

2. රජයේ සේවකයෙකු නම් අදාළ ඡන්ද බලප්‍රදේශයේ රාජකාරී නොකරන බවට නීතිමය පිළිගත් ලේඛනයක් ලබා ගැනීම / රාජ්‍ය නිලධාරියෙකු නොවන්නේ නම් ඒ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ලබාදිය යුතුය.

3. වත්කම් බැරකම් ප්‍රකාශ

### කාන්තා නියෝජනය

දශක ගණනාවක් තිස්සේ සංවිධාන හා පුද්ගලයන් ගෙන ගිය අරගලයක ප්‍රතිඵලයක් ලෙස පළමුවරට පළාත් පාලනයේ ලැබූ කාන්තා කෝටාව ආපසු හැරවීම හෝ අඩු කිරීම මෙම සමාලෝචනයේදී සිදු නොවිය යුතු බව අප අවධාරණයක කරමු. එමෙන්ම පසුගිය පළාත් පාලන මැතිවරණය හරහා තේරී පත්වූ කාන්තා සභිකයන් හා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මත කාන්තා නියෝජනයේ ගුණාත්මකබව තීරණය කිරීම හෝ දුර්වලතා මතු කිරීම නොකළ යුතුය. ඊට ප්‍රධානතම හේතුව වන්නේ පළමුවරට මෙම කෝටාව ක්‍රියාත්මක වීමේදී දේශපාලන පක්ෂ සුදුසුම පුද්ගලයන් තෝරා ගැනීමට ක්‍රියා නොකිරීම හා පත්වූ කාන්තාවන්ට නිදහසේ කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ගැනීමට ඔවුන්ද අපද අසමත් වූ බැවිනි. එමෙන්ම එකී අභියෝග ජයගෙන ඉදිරියට පැමිණි කාන්තාවන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් මතු කර ගැනීමටද මෙතෙක් අප අසමත්වී ඇත. ඒ අනුව කාන්තා නියෝජනය පිළිබඳ පහත යෝජනා ඉදිරිපත් කරමි.

1. කාන්තාවන් සඳහා වන 25% අනිවාර්ය කෝටාව එලෙසම තබා ගත යුතුය.

2. කාන්තාවන්ගේ තරග කිරීමේ කෝටාව 10% සිට 15% දක්වා වැඩිකළ යුතුය.

3. තරග කර පරාජය වන කාන්තාවන් අතුරින් වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ගන්නා කාන්තාවන්ට ලැයිස්තු හරහා තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

**<u>කාන්තා සභිකයින් තේරීම සඳහා ක්‍රමවේදයක්</u>**

කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ඇති කල කෝටාව පසුගිය මැතිවරණයේදී ක්‍රියාත්මක වූ ආකාරය බරපතල විවේචනයක් සමාජය තුළ මතු වී ඇත. විශේෂයෙන්ම ලැයිස්තු වලින් කාන්තාවන් තෝරා ගැනීමේදී කිසිදු පදනමක් හෝ විනිවිධභාවයක් නොතිබූ අතර ආසන සංවිධායකයින් තම අභිමතය පරිදි තෝරා ගැනීම් සිදුවිය.

එබැවින් කෝටා ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ලැයිස්තුව කිසියම් තෝරා ගැනීමේ නිර්ණායකයන් ඇති කරන ලෙසත්, උදා - දේශපාලන අත්දැකීම්, කිසියම් විශේෂ ක්ෂේත්‍රයක ප්‍රවීනතාවය (ජාතික ලැයිස්තුව ආකාරයට) එකී ලැයිස්තුව ආවෘත ලැයිස්තුවක් ලෙස සකස් කරන ලෙසත් යෝජනා කරමු.

**<u>ඡන්ද දායකයාට අපේක්ෂකයා තෝරා ගැනීමට ක්‍රමවේදයක්</u>**

2018 පෙර පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුළ ඡන්ද දායකයාට තම පක්ෂය හා අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා වඩා ප්‍රජාතන්ත්‍රවාදී ඉඩක් ලබා දී තිබිණ. එහෙත් වත්මන් ක්‍රමය තුළ පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම තෝරා ගැනීමට ඉඩකඩ තිබුන ද ප්‍රතිපත්තිමය වශයෙන් තමා කැමති පක්ෂයෙන් ඉදිරිපත් කර ඇති අපේක්ෂයා තමාගේ නියෝජිතයා ලෙස නුසුදුස්සෙකු වුවද ඡන්ද දායකයාට ද අදාල පක්ෂයට ඡන්දය ලබාදෙන්නේ නම් විකල්පයක් නොමැත

ඒ සඳහා කොට්ඨාස මට්ටමෙන් අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ තිදෙනෙක් ඉදිරිපත් කර ඡන්ද දායකයන්ට යම් තෝරා ගැනීමට ඉඩකඩ ලබාදිය හැකි නම් එය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වනු ඇත. ඒ හරහා දේශපාලන පක්ෂ යෝජනා ලබා දීමේදී මුහුණු දෙන ගැටලු වලට පිළිතුරක් සපයනු ඇත.

**<u>ඡන්ද දායකයාට මුලු පළාත් පාලන බල ප්‍රදේශය තුළ තමා වඩාත්ම කැමැති අපේක්ෂකයින් තේරීමට ඉඩක්.</u>**

වර්තමානයේ පළාත් සභා හා පාර්ලිමේන්තුවේ සිටින සැළකිය යුතු පිරිසක් තම දේශපාලන ගමන ආරම්භකරනු ලැබූයේ පළාත් පාලන ආයතන තුළිනි. 2018 ට පෙර පැවැති මැතිවරණ ක්‍රමය මගින් අපේක්ෂකයින් අතුරින් ජනප්‍රියම පුද්ගලයාට මුලු බලප්‍රදේශය තුළම මනාප ලබාගෙන තම ඉදිරි දේශපාලන ගමන ආරම්භ කළ හැකිවිය. ඒ සඳහා යම් තක්සේරුවක් ලබා ගැනීමට ඔවුනට පළාත් පාලන මැතිවරණයෙන් හැකිවිය. ඒ අනුව ඉදිරි සංශෝධනයේදී ඒ ඒ පක්ෂවලින් ඉදිරිපත්වී සිටින අපේක්ෂකයන් අතුරින් තමා වැඩිපුරම කැමැති අපේක්ෂකයාට මනාපයක් සළකුණු කිරීමට ඉඩක් ලබාදිය හැකිනම් වටිනේ ය.

**<u>ප්‍රචාරක වියදම් සීමා කිරීම</u>**

පසුගිය පළාත් පාලන මැතිවරණයේදී සමහර අපේක්ෂකයන් ඉතා කුඩා කොට්ටාසයක් වෙනුවෙන් කෝටි ගණන් මුදල් වියදම් කල බව වාර්තා විය. මෙය ඡන්ද මිලදී ගැනීම හා සමාන මට්ටමකට පත්විය හැකිය.

එමෙන්ම විශාල මුදලක් වියදම් කරන අපේක්ෂකයා ජයග්‍රහණයෙන් පසු එම මුදල උපයා ගැනීමට ද උත්සහ කරනු ඇත.

ඒ අනුව භූගෝලීය සාධක හා ඡන්ද දායක ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඒ ඒ කොට්ඨාස සඳහා හෝ පළාත් පාලන බල ප්‍රදේශ සඳහා අපේක්ෂකයෙකුට කල හැකි උපරිම වියදම් සීමාවක් පැන වීමට යෝජනා කරමු.

මැතිවරණයකට පෙර සෑම අපේක්ෂකයෙකුටම වෙනම ගිණුමක් ආරම්භ කල යුතු අතර සියලු වියදම් එම ගිණුම හරහා සිදුවිය යුතු අතර මැතිවරණය අවසානයේ ගිණුම් පිළිබඳ විදිමත් වාර්තාවක් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීවරයාට භාර දිය යුතුය.

**තරුණ නියෝජයට ඉඩක්**

තරුණ අසහනය පිළිබඳ තිබූ කමිටු වාර්තා සැළකිල්ලට ගනිමින් 2018 පෙර පැවැති පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුළ තරුණ ප්‍රජාවට කෝටාවක් ලබාදී තිබුණි. ඒ හරහා පාර්ලිමේන්තුව දක්වා ගිය පිරිස බොහෝය. එහෙත් වර්තමානයේ ඒ සඳහා ක්‍රමවේදයක් සැකසී නොමැත. සෑම ක්ෂේත්‍රයකටම කෝටා ලබාදීම අසීරු වුවද තරුණයන් සඳහා අවම වශයෙන් තරග කරන හෝ නම් කරන ලද ලැයිස්තු අතුරින් යම් ප්‍රතිශතයක් වෙන් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමු.

**හොඳම පරාජිතයාට ලැයිස්තුවේ ප්‍රමුඛතාවය**

වර්තමාන පළාත් පාලන මැතිවරණ ක්‍රමය අනුව ලැයිස්තු දෙකක් ක්‍රියාත්මක වේ. එනම් තරග කරන ලැයිස්තුව හා අනුපාත ක්‍රමයට හිමිවන සහිකධූර ලැයිස්තුව වශයෙනි. (කාන්තා ලැයිස්තුව ද ඇතුලත්ව) එමෙන්ම මෙහි දෙවන ලැයිස්තුවේ සිටින පිරිස මැතිවරණයට සක්‍රීය දායක නොවූවද පක්ෂයේ අභිමතය මත ඔවුන් පත්විය හැකිය. එහිදී ඔවුන්ට හිමිවන සභික ධූර ප්‍රමාණය තීරණය වන්නේ තම පක්ෂයේ තරග කරන අපේක්ෂයන් ලබා ගන්නනා ඡන්ද ප්‍රමාණය මතය. එහෙත් ඔවුන් සියලු කොට්ඨාස ජයග්‍රහනය කළහොත් ලැයිස්තුවේ සිටින පිරිසට හිමි වන්නේ ඉතා අඩු ප්‍රතිශතයකි. එබැවින් ලැයිස්තුවේ සිටින පිරිස අපේක්ෂා කරන්නේ තම කණ්ඩායම ඉහල ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන එහෙත් කොට්ඨාස පරාද වීමයි.

මේ පිළිබඳව ගොඩනැගී ඇති බරපතල සමාජ මතය වන්නේ ලැයිස්තුව  හරහා පත්වන සභිකයන් පිං මන්ත්‍රීවරු ලෙස සමාජගත වීමයි. එමෙන්ම පසුගිය මැතිවරණයේදී තරග තරග කළ අපේක්ෂකයන් විශේෂයෙන්ම ඉහළ ඡන්ද ප්‍රතිශතයක් ලබා පරාජය වූ අපේක්ෂකයන් නොසලකා ආසන සංවිධායකවරුන් තම අභිමතය මත ලැයිස්තුවලින් පත් කිරීමයි.

මෙම ගැටලුව යම් ප්‍රමාණයකට අවම කිරීම සඳහා අප යෝජනා කරන්නේ කාන්තා නියෝජනය 25% ශාක්ෂාත් කිරීම සඳහා නම් කරන ප්‍රමාණය ඉක්මවා යම් දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට පත් කිරීමට ඉඩකඩ ලැබෙන්නේ නම් එහිදී තම පක්ෂයේ අදාළ පළාත් පාලන බලප්‍රදේශයේ තරග කර පරාජය වූ අපේක්ෂකයන් අතරින් ඉහළ ඡන්ද ප්‍රතිශතයක් ලබා ගන්නා අපේක්ෂකයන්ගේ අනුපිළිවෙලට පත් කරන ලෙසයි. එමෙන්ම කාන්තා කෝටාවට අදාළව නම් කිරීමේදී ද තරග කළ කාන්තා වන් අතුරින් පරාජය වූ කාන්තා අපේක්ෂිකාවන් ගෙන් අවම වශයෙන් එක් අයෙකු, ලබාගන්නා  ඡන්ද ප්‍රමාණයේ ප්‍රතිශතය මත පත්කළ යුතු බවය.

මේ හරහා තරග කරන පිරිසට සාධාරණයක් වන අතර පිං මන්ත්‍රී සංකල්පය ද සමාජයෙන් බැහැර කළ හැක.

**ස්වාධීන කණ්ඩායමක නායකයෙකු ඉවත් වීම/මිය යෑම**

ස්වාධීන කණ්ඩායමක නායකයා මිය ගිය හොත් හෝ ඉල්ලා අස්වුවහොත් එම කණ්ඩායමට නායකයෙකු පත් කර ගැනීම සඳහා නීතිමය ක්‍රමවේදයක් සැකසිය යුතුය. නොඑසේනම් ස්වාධීන කණ්ඩායමක නායකයෙකු නොමැති අවස්ථාවක අදාල කණ්ඩායමේ පුරප්පාඩු පිරිවීම සඳහා ක්‍රමයක් සකස් කල යුතුය.

**පළාත් පාලන ක්‍රමයේ අභිවෘද්ධිය සඳහා යොමුකළ යුතු වෙනත් කරුණු**

1. පළාත් පාලන සේවය නැවත ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය  යොමුකළ යුතුය.

2. පළාත් පාලනය පිළිබඳ පුහුණුව ලබන නිලධාරීන් වෙනත් ආයතනවලට මාරුවීම මගින් විශේෂඥ දැනුම පළාත් පාලනයට අහිමිවී යයි. එය වැළැක්වීම සඳහා මාරු කිරීම්වලදී එකී මාරුවීම් පළාත් පාලන ආයතන තුළම සිදු කිරීමට ක්‍රමවේදයක් සැකසීම.

3. පසුගිය කාලය තුළ පළාත් පාලන ආයතනවල ස්ථාවර භාවය බරපතල ලෙස අභියෝගයට ලක්වූ බැවින් ස්ථාවරභාවය බලපාන කරුණු අධ්‍යයනය කර එය වළක්වා ගැනීමට ක්‍රමවේදයක් සැකසීම.

4. පළාත් පාලන පනත පිළිබඳ සභිකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ වැඩපිළිවෙලක්.

5. පළාත් පාලන පනත එක් එක් සහා විවිධ ආකාරයට අර්ථ ගන්වා ගෙන ඇති බැවින් එම පනත්වල අවිනිශ්චිත හෝ මතභේදකාරී කොටස් සඳහා නීතිමය නිර්වචනයක් ඇතුලත් පිළිගත් ලේඛනයක් සැකසීම.

6. පළාත් පාලන ආයතනවල කමිටු ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මඳහා පෙළඹවීමක් ඇති කිරීම.

7. සභිකයන් අතර සහා අරමුදල් සංවර්ධන කටයුතු සඳහා බෙදීයාමේදී සෑම සභිකයෙකුටම අවම මුදලක් හෝ වෙන්වන ආකාරයේ ක්‍රමවේදයක්.

8. පළාත් පාලනය දේශපාලනයෙන් ගලවා ගැනීම.

පළාත් පාලන ආයතන නීතිමය පදනමකින් තොරව පක්ෂ හා විපක්ෂ ලෙස බෙදී කටයුතු කිරීම වැළැක්වීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් ඇතිකළ යුතුය. එමෙන්ම ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

9. පළාත් පාලන ආයතවලට අදාළව ජනගහනය, භූගෝලීය සීමා, සැළකිල්ලට ගනිමින් වසර කිහිපයකට වරක් හෝ නිලධාරී ප්‍රමාණය තීන්දු කිරීම.

10. රාජ්‍ය ආයතවලින් ලැබිය යුතු බදු මුදල් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් සැකසීම.

11. ජනගහනය හා භූගෝලීය විෂමතා අවම කිරීමට

වර්ග කිලෝමීටර් 104.8 ක් තුළ පිහිටා ඇති පවුල් 70475 කින් යුත් 264101 ක ජනගහනයක් සහිත හෝමාගම ප්‍රාදේශීය සභාව සහ ව.කි.හ 0.1818 තුළ පිහිටා ඇති පවුල් 3654 කින් යුත් 14717 ක ජනගහනයකින් යුත් කඩුගන්නාව නගර සභාව දෙසත් හොඳින් අධ්‍යයනය කරන්නෙකුට බරපතල විෂමතාවයක් නිර්මාණය වී ඇති බව පැහැදිලි වේ. පසුගිය පළාත් පාලන මැතිවරණයට පෙරාතුව විශාල භූමි ප්‍රදේශයක් තිබූ අඹගමුව ප්‍රාදේශීය සභාව පාලනයේ පහසුව සහ සේවාවන් ලබාදීම සඳහා ජනතාවට පහසුවෙන් ප්‍රවිෂ්ඨ වීම සඳහා නෝවුඩ් සහ මස්කෙළිය නමින් අලුතින් පළාත් පාලන ආයතන තුනක් ලෙස නම් කිරීම ද ඵලදායී විකල්පයක් ලෙස සඳහන් කළ හැක.

**12.** පළාත් පාලන ආයතනයක් ඉහළ ශ්‍රේණියකට ( Up grade) ගෙනඒම සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබිය යුතු බව

පසුගිය කාලය තුළ දේශපාලන අවශ්‍යතා මත එක්වරම ප්‍රාදේශීය සභා , මහනගර සභා බවට පත් වූ අවස්ථා නිරීක්ෂණය විය. එබැවින් පළාත් පාලන ආයතනයන් ඉහළ නැංවීම සඳහා විධිමත් නිර්ණායකයක් හා විධිමත් ක්‍රමවේදයක් ඇති කළ යුතුය.

13. පළාත් පාලන ආයතන වලට පර්යේෂණ නිලධාරියෙකු පත් කිරීම.

පළාත් පාලන ආයතන වල නියෝජිතයන්ට කාලීනව වැදගත් වන කාරණා පිළිබඳව දැනුවත්ව අදහස් දැක්වීමට සෑම පළාත් පාලන ආයතනයකටම "සමීක්ෂණ නිලධාරියෙකු"පත් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුයි.

14. පළාත් පාලන ආයතන වලට භාෂා පරිවර්තකයෙකු පත් කිරීම.

බොහෝ පළාත් පාලන ආයතන වල සිංහල සහ දෙමළ භාෂා නියෝජනය කරන සභිකයින් සිටින හෙයින් භාෂා ප්‍රතිපත්තියට මුල් තැන දෙමින් සෑම පළාත් පාලන ආයතනයකටම භාෂා පරිවර්තකයෙකුගේ සේවාව ලබාදීම කෙරෙහි අවධානය යොමු විය යුතුයි.

15. මහජන ගැලරිය

මහජන ගැලරි සක්‍රිය කිරීම වෙනුවෙන්ද යම් වැඩ පිලිවෙලක් සකස් කිරීම පිළිබඳවද අවධානය යොමු විය යුතුයි.